# Living the Lotus

## Buddhism in Everyday Life

1
2025
VOL. 232




Rissho Kosei-kai of Oklahoma

**Living the Lotus**
**Vol. 232 (January 2025)**

Senior Editor: Keiichi Akagawa
Editor: Sachi Mikawa
Copy Editors: Ruklanthi Palipana, Rajitha Maduranga
published by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124 FAX: +81-3-5341-1224
mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life（සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.）යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදාහැරීම සිදු කරනු ලැබේ.

# අපි සැවොම ක්ෂේම භූමියක හැඟීමට පත්වෙමු

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය




## නව වසර නමැති 'ආරම්භක ස්ථානය'

සුභ නව වසරක් වේවා! වසරක ආරම්භය සියලුම දෙනා මෙලෙස පිළිගෙන, සියලුම දෙනා එකවිටම නව ආරම්භයක් ගනු ලබන ජපානයේ නව වසර පිළිබඳව පැවසුවහොත් එය වසරක 'ආරම්භක ස්ථානය' වේ. තවද, නව වසරක් යනු පසුගිය වසර පිළිබඳව ස්වයං විමර්ශනයක් කර තම ප්‍රතිඥ අලුත් කරගැනීමටත්, නැවුම් ආරම්භයක් ලැබීමටත් අගනා අවස්ථාවකි. එමනිසා, සයිතෝ මොකිචි කවියා 'නව වසරක ඇරඹුමේදී එක් දෙයක් හිතට ගනිමු' ලෙස රචනා කර ඇති පරිදි, මෙම ආරම්භක ස්ථානයේදී එම වර්ෂය ගත කිරීම සඳහා හොඳින් සූදනම් විය යුතුයි. ඒ සඳහා, ඔබ මොනවාද අධිෂ්ඨාන කරගත්තේ?

මේ වසරේ මගේ 88 වෙනි උපන් දිනය සමරන අතර, මම ඒ පිළිබඳව කෘතවේදී වන අතර එය ආශිර්වාදයක් ලෙස සලකමි. කෙසේ වුවද, වයස්ගත වුවද වර්ධනය සහ දියුණුව අරමුණු කරගැනීම නියම මනුෂ්‍ය ස්වභාවය නම්, මේ අවුරුදු 88 යනු ජීවිතයේ එක් නැවතුම්පොළක් වේ. එසේම පහුවන නැවතුම් පොළක්ද වේ. එක් කන්දක් තරණය කල පසු ඊළඟ කන්ද ඉලක්ක කරගෙන ගමන් කල යුතු යයි මම සිතමි. එම අදහසෙන් මෙම වසරේ නැවතත්, සෑම විටම භක්තිමත් සහ මෛත්‍රී සහගත හදවත අමතක නොකර ඉදිරියට ගමන් කර වර්ධනය වීමට බලාපොරොත්තු වෙමි.

මෙය, කිසි දිනක වෙනස් නොවන මගේ වාර්ෂික සැලසුම වන අතර, මෑත වර්ෂවලදී මම විශේෂයෙන්ම සැලකිල්ලක් දක්වන්නේ මානව සංවර්ධනයේ වැදගත්කම පිළිබඳවයි.

අභ්‍යවකාශයේ පාවෙන, නිල් පැහැති ජලය පිරි ග්‍රහලෝකයක් වන පෘථිවියේ පරිසරය වසරෙන් වසර පිරිහෙන අතර, මිහිතලයේ ජීවත් වන මිනිසුන් අතර අඛණ්ඩව ගැටුම් සහ යුද්ධ ඇති වේ. මෙම යථාර්ථය පිළිබඳව සිතන විට, අන් අයගේ වේදනාව වටහා ගත හැකි මනුෂ්‍යත්වයෙන් පිරි පුද්ගලයන් පෝෂණය කිරීම තම සැලසුම බවට පත් කර ගැනීමේ අරමුණ අපගේ හදවත් ස්පර්ශ කරනු ඇත. එයට හේතුව, මිනිස් හදවත සහ පරිසරය යන දෙකටම ගැලපෙන සුන්දර මිහිතලයක් ඉතුරු කිරීමේ වගකීම අප සතු වන බැවිනි.

## හදවතේ ශාඛයක් රෝපණය කරමු

අපගේ සංවිධානයේ 100වන සංවත්සරය වෙනුවෙන්, මම මින් පෙර අවස්ථාවක මානව සම්පත් වර්ධනයට වැදගත්කමක් ලබා දීමට කැමති බව පැවසුවෙමි. බෞද්ධයන් ලෙස අපගේ දෘෂ්ටි කෝණයෙන් බුදුදහමේ ඉගැන්වීම් තුළින් බලන විට, තමන්ට අවශ්‍ය වන්නේ තම සතුට පමණක් නොව, තම පවුල, ප්‍රදේශවාසීන් සහ ලෝකයේ දුර බැහැර ප්‍රදේශවල ජීවත්වන මිනිසුන්වද සතුටට පත් කිරීමටය. එසේ සියල්ලන්ම දුකින් මුදවා ගැනීමේ බලාපොරොත්තුවෙන් තම උපරිමය කරන මෛත්‍රී සහගත හදවතකින් යුත් පුද්ගලයන් වැඩිවීම එනම්, බෝධිසත්වයන් පෝෂණය කිරීම වේ.

පුද්ගලයන්ට මානසික ශාන්තියක් ලබා දෙන ක්ෂේම භූමියක් බඳු සිතක් ඇති බෝධිසත්වයන් යම් ස්ථානයක සිටියිද, එම ස්ථානය ක්ෂේම භූමියක් බවට පත් වේ. එසේම, එබඳු පුද්ගලයන් රැස් වූ විට එකම ක්ෂේම භූමියක සිටිනවා මෙන් හැඟීමක් ඇතිව, නොකඩවා එම හැඟීම විහිදුවන ස්ථානක් බවට රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන විහිදී යනු ඇතැයි මම පරමාදර්ශීව සිතමි. සත්‍ය ලෙසටම, මෙය අපගේ සංවිධානයෙහි වර්ධනය සඳහා වන අරමුණක් නොව, පෘථිවියේ සහ මානව වර්ගයාගේ අනාගතය පිළිබඳ දැඩි  අනතුරුදායක හැඟීමකින් පැමිණෙන පරමාදර්ශයක් මිස අන් කිසිවක් නොවේ.

අතීතයේ, ශාක්‍යමුණි බුදුන් වහන්සේව පවා ඝාතනය කිරීමේ චේතනාවෙන් සිටි පුද්ගලයන් සිටියාක් මෙන්, මනුෂ්‍යත්වයේ උපතේ සිට තමන්ට කැමති දේ කිරීමට ඇති මිනිසුන්ගේ ආශාව කිසිද වෙනස් නොවේ. එපමණක් නොව, මිනිසාගේ ආශාව සහ ප්‍රචණ්ඩත්වය නොකඩවා වැඩි වෙමින් පවතී. නමුත්, ආශාවන්ට සීමාවක් නොමැති සේම, 'පරමාදර්ශී බවද අසීමිත විය යුතුය' ලෙස අපගේ මුතුන් මිත්තන් අපට ඉගැන්වීය. පරමාදර්ශයන් නොමැතිව ප්‍රගතියක් නොමැති අතර, පරමාදර්ශයන් යථාර්ථයක් බවට පත් කිරීමේ කාර්යය මිනිස් ජීවිතය නම් වේ. එසේම, අපි එම පරමාදර්ශයන් සාක්ෂාත් කරගැනීමේ ආරම්භක රේඛාවේ අපි එකිනෙකා සිටගෙන සිටිමු. පළමුව තමන් තම පවුල තුළ හදවතේ ශාඛයක් රෝපණය කර ක්ෂෙම භූමියක් බවට පත්ව, තම පවුල අසල්වැසියන්ට ක්ෂේම භූමියක් වීමෙන් එය ආරම්භ වේ.

කෙසේ වුවද බුදු දහමේ, අන් අයගේ ජීවිතය නැති කිරීම 'ප්‍රාණඝාතය' විශාල පාපයක් වේ. එම නිසා, අන් අය කෙරෙහි අනුකම්පා සහගත ක්‍රියා සහ වචන භාවිතය ආදී මෛත්‍රිය දිනපතා ප්‍රගුණ කිරීමෙන්, ජීවිතයේ අනර්ඝත්වය, තමා සහ අන් අය අතර ඇති එකමුතුකම පිළිබඳ හැඟීම අවබෝධ කරවයි. එවැනි පිළිවෙත් පරාර්ථකාමී වන අතර, එය මිනිසුන්ගේ හදවත් තුල නව ක්ෂේම භූමියක් බවට පත්විය හැකි නව මූලයන්ද රෝපණය කරනු ඇත. මේ ආකාරයට අප බොහෝ මිනිසුන් සමඟ මිත්‍ර වී එකිනෙකාට කෘතවේදීව අපගේ ජීවිතය උපරිමයෙන් ගත කිරීම, නිර්මාතෘ තුමා විසින් 'උරුමය භාර දෙන්නන් සඳහා වන සූත්‍ර සජ්ඣායනයයි' ලෙස ප්‍රකාශ කල අතර, එය අනාගතයට සම්බන්ධ වන 'අනාගත සූත්‍ර සජ්ඣායනය' ද වේ.

'කෝසෙයි' ජනවාරි කලාපය ඇසුරිණි



# බුදුන් වහන්සේගේ, සද්ධර්මයේ සහ ධර්ම මිතුරන්ගේ ආශිර්වාදයෙන් බෝධිසත්ව මාර්ගයේ ගමන් කිරීම

## - කියෝකයිචෝ නම් රාජකාරිය තුලින් ඉගෙනගත් දෑ.

ක්‍රිස් රදොසෝ මිය
කියෝකයිචෝ, ඇමෙරිකාවේ ඔක්ලහෝමා ශාඛාව

බුදුන් වහන්සේගෙන්ද, නිර්මාතෘ තුමාගෙන්ද, නිච්කෝ නිවානෝ තුමාගෙන්ද, පැමිණ සිටින සියළු දෙනාගෙන්ද අවසරයි.

අද දින, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ කියොකයිචෝ කෙනෙකු ලෙස, අත්දැකීම් වලින් ඉගෙනගත් දේ ඔබත් සමග බෙදගැනීමට මට අවස්ථාව ලබාදීම ගැන හැමදේනාටම බොහොම ස්තූතියි. මෙතැන් සිට මම ඉගෙනගත් කරුණු කාරණා කිහිපයක් ගැන සදහන් කරන්නම්.

මුලින්ම ඉගෙනගත් කාරණයනම්, 'එක් පුද්ගලයෙකුගේ ශක්තියෙන් කල හැකි කිසිවක් නොමැත' යන්නයි.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල, ධර්මයට කැපවන සහ ධර්මය ව්‍යාප්ත කරන 'ධර්ම දේශකයන්' වටා උත්සාහයට ගැලපෙන මිනිසුන් උපකාරයට පැමිණෙන බව සදහන් වනවා. මමත් මේ මොහොත දක්වාම විශාල පිරිසකගේ සහයෝගයෙන් මගේ රාජකාරිය ඉටුකරමින් පැමිණියා. (එම වටහා ගැනීමත් සමග මට උත්සාහයෙන් කැපවීමේ ශක්තිය ගැන විශ්වාස කරන්න හැකිවුනා.)

දෙවනියට 'එක් එක් පුද්ගලයන් බුද්ධ මාර්ගයේ ගමන් කරන විට, ඔවුනට ආවේනික වූ වේගය අගය කිරීම වැදගත්' යන්න ඉගෙනගත්තා. සාමාජිකයින් ගත් කල ධර්ම කරුණු අවබෝධ කරගෙන ක්‍රියාවටනංවා වර්ධනය වීමට කාලයගත් පුද්ගලයින් සිටියා. කෙසේ වෙතත්, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ 'විශ්වාසය හා අවබෝධය' යන පරිච්චේදයේ එන දිලිදු පුත්‍රයාගේ උපමා කතාව තුල එම දිලිදු පුත්‍රයා ධර්මය අවබෝධ කරගැනීමට අවුරුදු 20 ක් ගතකලා, මෙන් එක් එක් පුද්ගලයන්ට ආවේනික වු වර්ධන වේගයක් පවතින බව වටහා ගත්තා. (මේ තුලින් මම ඉවසීම සහ උපාය කෞෂල්‍යයයේ වැදගත්කම ඉගෙන ගත්තා.)

තුන්වෙනියට 'ධර්ම ශාඛාවේ සියලුම සාමාජිකයින් මට වැදගත් ගුරුවරුන්' වන බව ඉගෙන ගත්තා. සාමාජිකයින් මගේ ක්‍රියාවන් ආදර්ශයට ගෙන කටයුතු කරනවා. එනිසා ඔවුන්ගේ ජීවිතයේ ගැටලුවක් ඇති වූ විට, කියෝකයිචෝ ලෙස මුලින්ම මා ගැන පසු විපරම් කර බැලීමට සිදු වූවා. (මේ තුලින් මට විවිධ දේ ගැන ඉගෙන ගන්න හැකිවූ අතර මගේ දැක්ම පුළුල් වුනා)

හතරවෙනියට ඉගෙනගත් කාරණය නම්, 'මේ ජීවිතය තුලදී සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉගෙන ගෙන එය අන් අයටත් ලබාදීමේ වැදගත්කමයි.' ධර්මය ඉගෙන ගැනීම හා ප්‍රායෝගිකව පුහුණු කිරීම ජීවිතයට මගපෙන්වීමක් මෙන්ම



කියෝකයිචෝ සාන්ලගේ විශ්‍රාම යාමේ උත්සවයේදී සෙප්පෝව පවත්වන ක්‍රිස් කියෝකයිචෝ සාන්
2024 නොවැම්බර් මස 18 වන දින

ආශිර්වාදයක් වූවා. (එම ඉගෙන ගත් කාරණයේ ආශිර්වාදයෙන් මම හොද කෘතවේදී හදවතක් ඇති පුද්ගලයෙක් බවට පත් වුනා.)

දිනක් මම භාවනාවේ යෙදී සිටින විට, බුදු පිලිමය සහ සාමාජිකයෙකු අතරින් මම හිදගෙන සිටිනවා සිහියට නැගුනා. සාමාජික පුද්ගලයා මාහට ඔහුගේ දුක පැවසූ අතර මා එක් අතකින් බුදුන් වහන්සේගේ අත අල්ලාගෙන සිටි අතර අනෙක් අතින් ඔහුගේ අත අල්ලගෙන සිටියා. ඒ මොහොතේ මම බුදුන් වහන්සේගේ ප්‍රඥාව අවැසි අයව බුදුන් වහන්සේ හා සම්බන්ධ කරන සම්බන්ධකයක් වූවා. (ඒ තුලින් මම මගේ මමත්වය විසිකර දමා, සියල්ලට ධර්මය කියාදෙන අයෙකු බවට පත් වුනා.)

මේ ආකාරයට කරුණු අවබෝධ වීමත් සමග මම පෙරටත් වඩා හොඳ හැඟීමකින් ධර්මය ඉගෙනීම කෙරෙහි කැපවූවා. පසුව සාමාජිකයින් සමග එකට එකතුව ඉදිරියට ගමන් කරනවිට නව කරුණු අවබෝධ වීමට පටන් ගත්තා.

මම මේ මොහොත දක්වා බොහෝ සේ, බුදුන් වහන්සේගේ, සද්ධර්මයේ සහ ධර්ම මිතුරන්ගේ ආශිර්වාදය ලබා තිබෙනවා.

ජපන් බෞද්ධ සංවිධානයක් පිහිටුවීමට කොහෙත්ම ඉඩ නොමැති අමෙරිකාවේ මධ්‍යයෙහි පිහිටි ක්‍රිස්තියානි භක්තිකයින් වැඩි වශයෙන් වෙසෙන ඔක්ලහෝමා නගරයේ රිෂ්ෂෝ කෝසෙයි කායි ශාඛාවක් පිහිටුවා බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කිරීමට හැකිවීම, බුදුන් වහන්සේගෙන් ලද ආශිර්වාදයේ ශක්තියට හොඳම උදහරණයක් ලෙස, මම දකිනවා.

ධර්මයේ ශක්තිය ගැන කල්පනා කරන විට මගේ හදවතට නැගෙන්නේ, අභාවයට පත් තම මවට අවුරුදු 50 ටත් අධික කාලයක් වෛර කල, ඔක්ලහෝම ශාඛාවේ සාමාජිකයෙකුවයි. මවට වෛර කල නිසා කිසි දිනෙක මවගේ සොහොන බැලීමට සුසාන භූමියටවත් නොගොස් තිබුණු අතර සොහොන් කොතක්ද නොතිබිණි. කෙසේ වෙතත් ධර්මය ඉගෙනගෙන පුරුදු පුහුණු කිරීමත් සමග ඇය මව වෙනුවෙන් සුසාන භූමියට ගොස් සොහොන් කොතක් සෑදීමට තීරණය කලා. ඇයගේ මව මත්පැන් පානයට ඇබ්බැහි වී සිටි නිසාවෙන් කුඩා කල සිටම ඇයට තම මවගේ කටයුතු කිරීමට සිදුව තිබුණු නිසා ඇයගේ ළමා කාලය අසතුටුදයකව තිබුණා. තවදුරටත් පවසනවානම්, ඇය කුඩා කාලයේදීම ඇයගේ මව රැකියාවට යන අතරතුර වාහනය පාලමකින් වැටී අනතුරට පත්වීමෙන් මරනයට පත්ව තිබුණා. එබැවින් ඒ ගැන පවුලේ අය සියදිවි නසාගැනීමක් ලෙස සිතා තිබුණා.

මවගේ සොහොන සොයාගැනීමට ඇය සුසාන භූමියට ගිය අවස්ථාවේ එහි භාරකරු විසින් මවගේ අනතුර ගැන මතකයේ තිබී එදින සිද්ධිය ගැන පොලිස් වාර්තා ඇයට පෙන්වූවා. එහි, මව වාහනය පදවමින් තිබූ දිශාවට විරුද්ධ දිශාවෙන් වැරදි ආකාරයට පැමිණෙන වාහනය තම රථයේ ගැටීම වළකා ගැනීමට සහ එම වාහනයට ඉඩ ලබාදීමට සිතා හදිසි තිරිංග යෙදූ අවස්ථාවේ වාහනය පාලනය කරගත නොහැකිව පාලමෙන් වැටීතිබුණු බව ලියා තිබුණා. ඒ අනුව තම මව සියදිවි හානිකරගෙන නොමැති බවත් ඉදිරියෙන් පැමිණි වාහනයට ඉඩ දීමට ගොස් අනතුර වූ බවත්, එම රියදුරුගේ ජීවිතය බේරුණු බවත් දැනගන්නට ලැබුණා. එදින සිදුවීම ගැන නිවැරදිව දැන ගැනීමත් සමග ඇය තම මව දෙස බැලූ ආකාරය හාත්පසින්ම වෙනස් වූවා. පසුව, අවුරුදු 50 ටත් වැඩි කාලයක් හිතේ තිබුණු දුක යම් තරමක් අඩු වුනා. රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වී ධර්මය ඉගෙනගෙන ආදිමුතුන් මිත්තන් වෙනුවෙන් පිං ලබාදීම නොකරන්නට, මෙම සිදුවීම ගැන හරියටම දැනගන්න නොහැකි වන්න තිබුණා.



හිල්ඩාබ්‍රෑන් ඔක්ලෝහෝමා ශාඛාවේ
මුල්ම කියෝකයිචෝ සාන් සමග

ධර්ම මිතුරන්ගේ බලය ශක්තික ගැන බලන කල තම මිය ගිය සහෝදරයා වෙනුවෙන් පිංපෙත් පැමිණවීමේ සූත්‍ර සජ්ජායනයක් කිරීමට වුවමනායි පැවසූ සහ සූත්‍ර සජ්ජායනයේ දෝෂි කලයුතුයි පැවසූ සාමාජිකාවක් සිහියට නැගෙනවා. සූත්‍ර සජ්ජායනය ආරම්භ කර ටික වෙලාවකින් ඇයට ආ දුක නිසා හැඟීම් පාලනය කර ගත නොහැකිව හැඬීමට පටන් ගත් අතර, සූත්‍ර පාඨ කියවීමට පවා නොහැකිව ගියා. එවිට එකවරම ස්වභාවයෙන්ම වෙනත් සාමාජිකාවක ඇය අසලට ගොස් සූත්‍ර සජ්ජායනය ආරම්භ කල අතර, එම සාමාජිකාව, දුකටපත් ඇයගේ හිත සන්සුන්ව නැවත් සූත්‍ර සජ්ජායනයට හැකිවන තෙක් සූත්‍ර සජ්ජායනය කරගෙන ගියා.

මේ ආකාරයට ලැබූ අත්දැකීම් මගේ ජීවිතයේ වටිනාම සම්පත් බවට පත්වුනා. මේ මොහොතේදීත් මගේ හදවත කෘතවේදීත්වයෙන් පිරී තිබෙනවා.

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ විශිෂ්ඨත්වය හා කාරුණික බව නිසා මට මෙවන් වටිනාම සම්පත් හිමිකරගැනීමට හැකි වුනා. නිර්මාතෘ තුමාටත්, නගනුමා සම නිර්මාතෘ තුමියටත්, නිච්කෝ නිවානෝ තුමාටත් ඒ වගේම කෝෂෝ මැතිනියටත් හදවතින්ම ස්තුතිවන්ත වනවා.

මීට වසර කිහිපයකට පෙර මම ජපන් සංචාරයකට ගිය අතර, එහිදී සාම්ප්‍රදයික උද්‍යාන කිහිපයන් නැරඹීමට අවස්ථාවක් හමුවුණා.. එම සෑම උද්‍යානයකටම ආවේණික වූ සුන්දරත්වයක් සහ ගැඹුරු අර්ථයක් තිබුණු අතර ඉතා හොඳින් නඩත්තු කරන බව වැටහුණා. එක් උද්‍යානයක විශාල පොකුණක් ඉදිකර තිබුණු අතර, අමුත්තන්ට පොකුණෙන් එගොඩට ගොස් නව කෝණයකින් උද්‍යානය දෙස බැලීමට පදික ගල් අතුරා පාරක් සකස් කර තිබුනා.

ඉන් වසර කිහිපයකට පසු, පදික ගල් පාරක් බෞද්ධ පුහුණු කිරීම අතරත් සමානකම් ඇති බව මට වැටහුණා. මට බෝධිසත්ව මාර්ගයේ ගමන් කිරීමට හැකිවන පරිදි, මාව ධර්ම මාර්ගයට ගත් ජ්‍යේෂ්ඨ සාමාජිකයන්, මා වෙනුවෙන්ම පදික ගල් පාරක් සකස් කර ධර්ම මාර්ගයේ ගමන් කල හැකිවන පරිදි පදික ගල් අසුරා ඇතිබව වැටහුනා. අවශ්‍ය අවස්ථාවලදී මාව මෘදු ලෙස ධර්ම මාර්ගයට යොමුකර පුරුදු පුහුණු කලයුතු දේ, කියවීමට සුදුසු දේ හා කතා කල යුත්තේ මොනවාද, ධර්මය බෙදාගන්නේ කෙසේද යන්න මට ඉගැන්වූවා. මීලග පියවර තබන්නේ කෙසේද යන බිය ඇති වූ අවස්ථාවන් තිබුණු නමුත්, ජේෂ්ඨයින් මග නිවැරදිව පෙන්වා ඇති බව වටහාගත් නිසා විශ්වාසයෙන් කටයුතු කරන්න හැකි වුනා.

මම නායකයෙකු ලෙස රාජකාරී භාරගත් මොහොතේ, මාව පෝෂණය කල ජේෂ්ඨයින්ගේ නායකත්ව විලාසය මට උරුම වන බව මට වැටහුණා. එය කුමක්ද කියනවානම්, සාමාජිකයින් එකිනෙකාට සමීපව අවධානය යොමු කිරීම, ඔවුන්ගේ හැකියාවන්, ප්‍රායෝගික කුසලතාවයන් සහ ඔවුන්ගේ ධර්ම පුහුණුව වෙනුවෙන් කැපවීම ගැන අවබෝධ කර ගැනීමට උත්සහකිරීම සහ ඔවුනට පුහුණු කිරීම් තුලින් වර්ධනය වීමට උපකාර වන ආකාරයට පදික ගල් මාර්ගය පෙන්වාදීමට වඩාත් සුදුසුම ක්‍රමය කල්පනා කලා.

මම අද මෙතන ඉන්නේ, විශාල ජේෂ්ඨයින් පිරිසකගේ ආශිර්වාදයෙනි. ඔක්ලහෝමා ධර්ම ශාඛාවේ හිටපු කියෝකයිචෝ යසුකෝ හිල්ඩබ්‍රෑන් සාන් සමග ධර්ම ශාඛාවේ දියුණුව වෙනුවෙන් වැඩ කිරීමට විශිෂ්ඨ අවස්ථාවක් හමුවුණා. ඇය ඉතා විශිෂ්ඨ උපදේශකවරියක් වූවා. විශාල පිරිසක් අප දෙදෙනාගේ කණ්ඩායම් ක්‍රියාවන් සහයෝගීතාව අගය කලා. කියෝකයිචෝ යසුයෝ සමග එකට ගතකල කාලය මගේ වර්ධනයට ඉමහත් ලෙස උපකාර වූවා. ධර්ම ශාඛාවේ කටයුතු වලදී මා සිතන අමෙරිකානු ක්‍රම වේදයන් ගැන විශ්වාස කල අතර, මා සිතන දේ ගැන අවධානය යොමු කරමින්, එය මා වටා සිටින අයට බලපාන ආකාරය ගැන කරුණාවන්තව පහදා දුන්නා. අවශ්‍යය ඕනෑම මොහොතක, ඕනෑම කරුණක් දෙස බලන්න කියාදුන් ඇයව මම නිරන්තරයෙන් විශ්වාස කලා.

ජපානයේදී 'ඔබ හොඳින්ද ?' කියා ඇසූ විට 'සැමගේ ආශිර්වාදයෙන් හොඳින් ඉන්නවා' කියා පවසන බව දැනගත්තා. මෙය අප අවට සිටින මිනිසුන් සහ සොබාදහම සමග අපගේ ගැඹුරු සම්බන්ධය පෙන්වන හොඳ ප්‍රකාශයක්. මට මේ වනතෙක් ජීවිතයේ විවිධාකාරවූ දේවල් ලැබුණා. අද ඒ ලැබුණු සියල්ලට කෘතවේදීත්වය පලකිරීමට හොඳ දවසක්. අතීතය ගැන පසු විපරම් කර කෘතවේදී වීම ඉතා පහසු කටයුත්තක්. නමුත් නිහඬ හදවතින් සිතා බැලුවොත්, මෙ මොහොත ගැනත් කෘතවේදී වන්න පුලුවන්. මක්නිසාද යත්, ඒ ඒ මොහොත තුල ජීවත් වීමට ලැබීම මෙ 'ජීවය' ගැන දකින්න හැකිනම් ස්වභාවයෙන්ම කෘතවේදිත්වය ඇති වන නිසා. ඇත්තෙන්ම එය ඉතාමත් සතුටු දයක අත්දැකීමක්.

ඔක්ලහෝමා ධර්ම ශාඛාවේ නව කියෝකයිචෝ ක්‍රිස් පීටර් මහතාව සාදරයෙන් පිළිගන්නා අතර මගේ හදවත ප්‍රීතියෙන් උද්දමයට පත්ව තිබෙනවා. ක්‍රිස් මහතා ප්‍රඥාවන්ත කාරුණික හදවතකින් යුත් නායකයෙක්. එතුමාටත් මෙම ධර්ම මාර්ගයේ හොඳින් ගමන් කරන්න හැකිවේවායි මම ප්‍රර්ථනා කරනවා.

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ධර්ම නායකයෙකු ලෙස ධර්ම මිතුරන් සමග කටයුතු කරන්න ලැබීම මට මහත් ගෞරවයක්. මේ මොහොත දක්වා වසර ගනනාවක් මට සහයෝගය දුන් සැමට මගේ අවංක කෘතවේදීත්වය පල කරමි. මෙම කෘතවේදී හැඟීමත් සමග මින් ඉදිරියටත් ධර්ම මාර්ගයේ ගමන් කරමින් කටයුතු කරනවා.

බුදුන් වහන්සේට ස්තුතිපූජා වේවා.<br>
නිර්මාතෘ තුමාටත් ස්තුතිපූජා වේවා.<br>
ඔබ සැමටත් බොහොම ස්තුතියි.



ක්‍රිස් පීටර්ස් නව කියෝකයිචෝ සාන්ට සුභ පතන<br>
ක්‍රිස් ලාඩෝස් කියෝකයිචෝ සාන්

## නිර්මාතෘ තුමාගේ ගුණානුස්මරන උත්සවය

ඔක්තෝබර් මස 04 වෙනි දින නිර්මාතෘ තුමාගේ අනුස්මරණ දිනයයි.

1999 අවුරුද්දේ ඔක්තෝබර් මස 04 වෙනි දින වයස අවුරුදු 92 දී අභාවප්‍රාප්ත වූ නිර්මාතෘ තුමාට උපහාර පිණිස සහ කෘතවේදිත්වය පළකරන සහ, එතුමාගේ ඉගැන්වීම් ප්‍රායෝගිකව පුහුණු කිරීමට පොරොන්දු වන උත්සවයක්.

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය පිහිටුවීමේ සිට, නිර්මාතෘ තුමා සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් ලොවතුල ව්‍යාප්ත කිරීමට, මිනිසුන්ව දුකෙන් මුදවා ගැනීමටත්, අන්තර් ආගමික සංවාද තුලින් ලෝක සාමය සාක්ෂාත් කර ගැනීමටත් වෙහෙස නොබලා කටයුතු කර තිබෙනවා. ඒ තුල එකිනෙකාට නමස්කාර කිරීම, එකිනෙකාව පිළිගැනීම, එකිනෙකා සමග බෙදා ගැනීම සහ එකිනෙකා සමග සහයෝගයෙන් කටයුතු කිරීම යන 'ඒකයාන ධර්මය' ඇතුලත් වනවා.







### දැනුමට යමක්

1979 අවුරුද්දේ නිර්මාතෘ තුමා ටෙම්පල්ටන් සම්මානයෙන් පිදුම් ලැබුවා. 1973 අවුරුද්දේ ආරම්භ කල මෙම සම්මාන ප්‍රධානය, ආගමික දියුණුව වෙනුවෙන් කැපවන පුද්ගලයන් අගය කිරීම වෙනුවෙන් ලබා දෙන සම්මානයකි. මෙය 'ආගමික ලෝකයේ නොබෙල් ත්‍යාගය' ලෙස හඳුන්වනු ලබයි.

※ කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

# ඉචිජෝ මත්සුරි, ඔඑෂිකි (දන්සන් පෙරහැර)







විවිධ හැඩයෙන් වර්ණයෙන් ආලෝකය පතුරවන මල් අල්ලන ලද පහන් කූඩු සහ එයටම ආවේනික වූ දේ රැගත් නඩ මැදි කරගත් බෙර නලා වැනි විවිධ සංගීත භාන්ඩ රිද්මයකට වාදනය කරමින්, නටමින් ගයමින්
ඉදිරියට ඇදෙන පෙරහැරක්.

මෙලෙස 'ඔඑෂිකි' යනුවෙන් හඳුන්වනු ලබන්නේ නිචිරෙන් ෂෝනින් අභාවයට පත්වූ දිනයේ (ඔක්තෝබර් 13) පැවැත්වූ පෙරහැර සහ එම අනුස්මරණයයි.

රිෂ්ෂෝ කෝසෙයි කායි හිදී, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ප්‍රචලිත කල නිචිරෙන් ෂෝනින් සහ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය පිහිටවූ අප නිර්මාතෘ තුමාගේ ගුණ සිහිපත් කර, 'කල සේවයට කෘතවේදීත්වය පළකිරීමට, සියලුදෙනා විශ්වාසයෙන් සහ එක සිතින් කටයුතු කරනවා' යන පොරොන්දුව අධිෂ්ඨානය අලුත් කිරීම වෙනුවෙන් සෑම අවුරුද්දකම පළවන ඉරිදා දින ජපානයේ ප්‍රධාන බුද්ධ මන්දිරය කේන්ද්‍ර කරගෙන පවත්වන පෙරහැර උත්සවය 'ඉචිජෝ මත්සුරි, ඔඑෂිකි' (දන්සන් පෙරහැර) ලෙස හඳුන්වයි.

### දැනුමට යමක්

නිචිරෙන් ෂෝනින් යනු, ජපානයේ චිබා ප්‍රාන්තයේ කමකුරා යුගයේ උපත ලැබූ භික්ෂූන්වහන්සේ නමක්. ඔහු වයස අවුරුදු 16 දී පැවිදි වන අතර විවිධ නිකා-යන් වල ඉගැන්වීම් ඉගෙන කමකුරා සහ හීඑයි කන්ද මුදුනේ ධර්ම පුහුණුව සිදු කලා. 'රිෂ්ෂෝ අන්කොකුරොන්' ග්‍රන්ථය ඇතුළුව තවත් ග්‍රන්ථ රචනා කල අතර, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් ප්‍රචලිත කිරීමට ජීවිත කාලයම කැප කලා.

※ කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

# ධර්ම මිත්‍රයන්ගෙන් මේ ලෝකය පුරවමු

## ධර්ම මිත්‍රයන්ගෙන් බුද්ධ මාර්ගයම වේ

නික්යෝ නිවානෝ තුමා
නිර්මාතෘ, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



ආනන්ද තෙරුණ් වහන්සේ විසින් සංඝයා පිරිස ගැන කල්පනා කර, බුදුන් වහන්සේගෙන්, 'යහපත් මිත්‍රයන් හා එකම ඇදහිලි කරන අය සිටීම බුද්ධ මාර්ගයේ හරි අඩක් ගමන්කලා වේ යැයි සිතනවා' යනුවෙන් පැවසූහ. එවිට බුදුන් වහන්සේ විසින්, 'නැහැ, අඩක් නෙවෙයි, යහපත් මිත්‍රයන් සමඟ ගත කරන විට එය මුළු ධර්ම මර්ගයම වේ' ලෙසින් පිළිතුරු දුන්හ.

බෞද්ධයන්ගේ මුලිකම කොන්දේසි වන්නේ 'ත්‍රිවිධ රත්නය සරණ යාමයි' බුදුන් සරණ, ධර්මයේ සරණ, සංඝයා සරණ යාම අනිවාර්යය අංගයක් වේ. ඒ අතරින් බුදුන් හා ධර්මය සරණ යාම සඳහා ලෙසින් ධර්මය ඉගෙන ගැනීම අපි ඉතාමත් කැපවීමෙන් කලත්, සංඝයා හා ධර්ම සගයන්, ධර්ම මිත්‍රයන් සරණ යාම ටිකෙන් ටික අඩු වී යයි.

බුදුන් වහන්සේ ධර්ම මාර්ගයේ සියල්ලම ධර්ම මිත්‍රයන් සේ වදාලේ, ඔවුන් තුලින් අපව දියුණු කර ගත හැකිය යන අනුවර්තනයෙන් යැයි සිතනවා.

ඒ මන්දයත්, අපි තනිව ධර්ම මාර්ගයේ ගමන් කරන විට, අලස වීමටත්, සැක සංකා මතුවීමටත්, නොයෙකුත් ආශාවන්ට පරාජය වේ. නමුත් එවැනි අවස්ථාවන් වලදී, ධර්ම මිත්‍රයන් සිටින විට, ඔවුන් අපිට ධෛර්යමත් කරන විට හෝ නිවැරදි දිශාව පෙන්වන විට ඕනෑම බාධකයකින් ගොඩයාමට හැකිවේ.

ඒ පමණක් නොවේ, අපි නොයෙකුත් ආකාරයේ ධර්මයේ පිහිට ආරක්ෂාව ලැබූ විට සම සතුට බෙදාහදා ගැනීමට, ධර්මය තහවුරු කරගැනීමට තව කෙනෙකු සිටීම කොතරම් සතුටක්වෙනවාද. එයින් අනෝන්‍ය වශයෙන් ධර්මාවබෝධය පුළුල් කරගැනීමට හැකිවීම වැදගත්වේ.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේද එම කරුණු සඳහන් වේ. බුදුන් වහන්සේ විසින් ධර්ම දේශනා කිරීමෙන් පමණක් සම්පූර්ණ නොවේ. පොළෝ ගර්භයෙන් මතුවී පැමිණි ප්‍රභූතරත්න තථාගතයන් වහන්සේ පහලව, බුදුන් වහන්සේ දේශනා කල ධර්මය 'සාදු සාදු මේ ධර්මය සත්‍යයි' ලෙසින් සාක්ෂි දැරූ විටයි සම්පූර්ණ වන්නේ. බුදුන් වහන්සේ හා ප්‍රභූතරත්න තථාගතයන් වහන්සේ ස්තූපය තුල වැඩල කර ආසන ගත්විට අංගසම්පූර්ණ ස්වරූපය බවට පත්වේ.

එබැවින් රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ සාමාජික අපිද හෝසාවන් වලදී තම ධර්ම අත්දැකීම් බෙදාහදා ගනිමින් සාක්ෂාත් කිරීම, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට අනුව අත්‍යාවශ්‍ය අංගයකි.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත,
'යහපත් බවේ බීජයන් වපුරමු' ග්‍රන්ථයේ 64-65 පිටු ඇසුරිණි



# Director's Column

## සාමාජිකයන්ට ආදරය කරන වසරක්

**කෙයිඉචි අකගාවා මහතා**
**රිෂ්ෂෝ කෝසෙයි කායි අන්තර්ජාතික මූලස්ථානය**

සුභ නව වසරක් වේවා!

මේ වසරත් ඔබ සියළුදෙනාට විශිෂ්ටත්වයෙන් පිරි නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා. 2024 වර්ෂයේ නම්, නව වසර දිනයේදීම ජපානයේ නොතෝ අර්ධද්වීපයේ විශාල භූමිකම්පාව ඇතිවුනා. ඉන් වසරක් ගතවී ඇති වර්තමානයේදීත් තවමත් ඔවුන්ගේ ජීවන රටාව පෙර තත්වයට පැමිණී නොමැති බැවින් හදවත වේදනාවෙන පෙලෙනවා.

තවද, එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා විසින් ප්‍රකාශ කරන පරිදි, 'ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමේ යුගය' නිමාවී, 'ගෝලීය තාපාංක යුගය' පැමිණ තිබේ. එයට අනුව, මුහුදු ජලයේ උෂ්ණත්වය ඉහළ යාම නිසා ආසාමාන්‍ය කාළගුණික තත්වයන් හේතුකරගෙන ලොව පුරා ස්වභාවික විපත් රාශියක් සිදුවූ වර්ෂයක් බවට පත්වුවා. එසේම, දැඩි රස්නය නිසා බොහෝ දෙනෙකුට ජීවිත පවා අහිමි වුන බව සදහන් ඉතාමත් වේදනාකාරී ප්‍රවෘත්තිද දුටුවා.

නොයෙකුත් දුක් වේදනාවන්ගෙන් එකතුකර ගත් ප්‍රඥාව කැටිකරගෙන මේ වසරේදිවත් ස්වභාව ධර්මය හා මනුෂ්‍යයන් එක්ව සමානාත්මතාවයෙන් ජීවත්වීමට හැකි පිරිසිදු දේශයක් ගොඩනගා ගැනීම සදහා පියවර තබනා වර්ෂයක් බවට පත්කරගැනීමට අධිෂ්ඨාන කරමි.

පසුගිය දිනක, මත්ද්‍රව්‍යට ඇබ්බැහිවූවන් පුණරුත්තාපනය කරන මධ්‍යස්ථානයක් සමඟ එක්ව කටයුතු කරන පුද්ගලයෙකුගෙන් ඉතා විශිෂ්ට වදනක් අසන්නට ලැබුනා. ඒ 'ඇබ්බැහිවීමේ' විරුද්ධ පදය 'සම්බන්ධවීම' බවයි. බෞද්ධයන් වන අපට එය ගලපාගැනීමේදී, 'ඇලීමෙන් මිදීම කළ හැකිවන්නේ සාමාජිකයන්ගේ ආදරය තුලයි' ලෙසින් පැවසීමට හැකිවේ. නිච්කෝ නිවානෝ තුමා මේ මස කියාදුන් පණිවුඩයේ සදහන් පරිදි, නොයෙකුත් ප්‍රශ්න විසද ගැනීමට හැකි වන්නේ, දිප්තිමත් කාරුණික හා උණුසුම් පුද්ගලය සබධතා ඇති ක්ෂේම භූමියක මෙන් සිටිනා සාමාජිකයන්ගේ ශක්තිය තුලින් බව විශ්වාස කරමින්, ත්‍රිවිධ රත්නයේ සරණ යමින් 2025 වසර ආරම්භ කිරීමට සිතනවා.




මූලස්ථානයේ පැවති වැඩසටහනකට සහභාගී වූ අකගාවා මහතා
2024 නොවැම්බර් 13 වනදින

# Rissho Kosei-kai International

**Make Every Encounter Matter**



## A Global Buddhist Movement




**Information about local Dharma centers**

**facebook**

**X**

We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp